සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved




වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**


11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | **84 S I,II**

නම: ............................................ | **ශිල්ප කලා** | කාලය පැය තුනයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. ජන කලාව ශ්‍රව්‍ය කලා හා දෘශ්‍ය කලා ලෙස ප්‍රභේද වේ. දෘශ්‍ය කලාවට අයත් කාණ්ඩය වන්නේ ,
I. ගොයම් කවි, ලී කැටයම් කලාව. II. ශාන්තිකර්ම , වන්නම්.
III. ලාක්ෂා , ස්වාර්ණාභරණ. Iv. වෙස්මුහුණු කලාව , ගොයම් කවි කලාව.


02. පහත රූප අතරින් ඝන ජ්‍යාමිතියට අයත් රූපය තෝරන්න.
I. 
II. 
III. 
Iv. 

03. පහත රූපයේ දැක්වෙන්නේ යකඩ වැටකි. එහි දැකිය හැකි ජ්‍යාමිතික හැඩතලය කුමක් ද?

I. ආයත චතුරස්‍රය කි.
II. රොම්බසය කි.
III. රොම්බාභය කි.
Iv. ඉහත සියල්ලම නොවේ.

04. අංශක 90 , 180 , 60 , 45 , 30 අගයන් හා සිරස් තිරස් රේඛා පහසුවෙන්ම ඇඳීමට භාවිත කළ හැකි ජ්‍යාමිතික උපකරණය මින් කුමක් ද?
I. විහිත චතුරස්‍ර යුගලය. II. කෝදුව. III. බෙදුම් කටුව. Iv. ටී රූල.

05. පහත රූප සටහනේ දැක්වෙන්නේ බිත්ති සැරසිල්ලකි. එහි දැක්වෙන ජ්‍යාමිතික හැඩතලය කුමක් ද?

I. වෘත්තයකි. II. ඉලිප්සයකි.
III. ගෝලයකි. Iv. චාපයකි.



06. මෙම නිර්මාණයේ දැක්වෙන්නේ ,

I. වෘත්තයක් තුල සප්තාස්‍රයක් ඇඳීම.
II. පාදයක දිග දුන් විට බහු අස්‍රය ඇඳීම.
III. වෘත්තයක් තුළ බහු අස්‍රයක් ඇඳීම.
Iv. වෘත්තයක් තුළ ෂඩාස්‍රයක් ඇඳීම.

07. ඝන වස්තුවක වක්‍ර පෘෂ්ඨයේ විකසනය සෘජුකෝණාස්‍රයක හැඩය ගනු ලබන්නේ ,
I. රොම්බසයක ය. II. පිරමීඩයක ය. III. ඝනකයක ය. Iv. සිලින්ඩරයක ය.


08. රූපයේ සේයා කර ඇති වෘත්ත කොටස හඳුන්වන්නේ කුමන නමින් ද?


I. කේන්ද්‍රික ඛණ්ඩය.
II. වෘත්ත ඛණ්ඩය.
III. වෘත්ත පාදය.
Iv. ජ්‍යාය.


09. ඉලිප්සයක් නිර්මාණය කිරීමේ දී අනිවාර්යයෙන්ම ලබා දිය යුතු දත්ත වන්නේ ,
I. මහා අක්ෂයේ හා සුළු අක්ෂයේ දිග. II. නාභි දෙක අතර දුර.
III. නියාමක අක්ෂය හා නාභිය අතර දුර. Iv. නියාමක අක්ෂයේ සිට සුළු අක්ෂය දක්වා දුර.


10 . පහත රූප සටහනේ දැක්වෙන්නේ සෘජු කෝණයක් සහ සරල කෝණයකි. මෙම කෝණ දෙකෙහි එකතුව වන්නේ,


I. 360
II. 270
III. 350
Iv. 180

11. පහත රූප මගින් දැක්වෙන්නේ චතුරස්‍ර වර්ග 4 කි. ඒ අතරින් පාද දෙකක් පමණක් සමාන්තර වන චතුරස්‍රය තෝරන්න.

I.


II.


III.


Iv.


12. රෙදිපිළි නිෂ්පාදනය දී සායම් ස්ථිර කර ගැනීම හා කල් පවත්වා ගැනීම සඳහා විශේෂ අවධානයක් යෙදනු ලබේ. ඒ සඳහා කරනු ලබන ක්‍රියාවලිය වන්නේ ,
I. පසු පිරියම් කිරීම යි. II. කාබනීකරණය යි. III. විරංජනය යි. Iv. මළහරණය යි.

13. ගෙතුම් නිර්මාණ කිරීමේ දී ඔබ අනුගමනය කළ යුතු ආරම්භක පියවර වන්නේ ,
I. තනිපට පිරවිලි ගෙතීම ය. II. පත්තෑයා ගෙතීම ය.
III. දෙපට පිරවිලි ගෙතීම ය. Iv. දම්වැල් ගෙතීම ය.

14. පින්තාරු කිරීමේ දී සියුම් ඉරි , ඉම් රේඛා , තිත් ආදිය ඇඳීමට සුදුසුම පින්සල් වර්ගය වන්නේ ,
I. රවුම් පින්සල්. II. සියුම් තිමා පින්සල්.
III. සේදුම් පින්සල්. Iv. විශාල සේදුම් පින්සල්.

15. මූලික වර්ණ මිශ්‍ර කර විවිධ වර්ණ සාදා ගනී. නිල් හා රතු වර්ණ මිශ්‍ර කර සාදා ගත හැකි වර්ණය කුමක් ද?
I. කොළ වර්ණය. II. දම් වර්ණය. III. කළු වර්ණය. Iv. තැඹිලි වර්ණය.

16. රෙදි පිළි අලංකාරණයේ දී පින්සල් වැනි සම්මත උපකරණ භාවිතයෙන් තොරව කරන පිළි අලංකරණ ක්‍රමය හඳුන්වන නම කුමක් ද?
I. ස්ටෙන්සිල් මුද්‍රණ ක්‍රමය. II. අච්චු මුද්‍රණ ක්‍රමය.
III. සරල පින්තාරු ක්‍රමය. Iv. අතින් පින්තාරු කිරීමේ ක්‍රමය.

17. රෙදි පිරියම් කිරීමේ දී රෙද්දේ ඇති අපද්‍රව්‍ය රසායනික ද්‍රව්‍ය මගින් පිලිස්සීමට ලක්කර කාබන් බවට පත් කිරීම හඳුන්වන්නේ ,
I. විරංජනය. II. කැඳහරණය. III. මළහරණය. Iv. කාබනීකරණය.

18. සේද රාමු මුද්‍රණයේ දී රාමුවට සවි කිරීම සඳහා ගන්නා විශේෂිත රෙදි වර්ගය වන්නේ කුමක් ද?
I. රැන්ගල්. II. විස්කෝස්. III. බෝල්ටින් ක්ලෝත්. Iv. පොලියෙස්ටර්.

19. නූල් වලට කැඳ දැමීමෙන් බලාපොරොත්තු වන්නේ ,
I. නූල් වල අපද්‍රව්‍ය ඉවත් කිරීම. II. නූල් විරංජනය කිරීම.
III. නූල්වලට ශක්තිය ලබා දීම. Iv. නූල්වලට සායම් දැමීම පහසු කිරීම.

20. මැටිවල සංයුතිය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ ,
I. $K_2OAl_2O_36SiO_2$ II. $Al_2O_32SiO_2\ 2H_2O$
III. AlOSiOHO Iv. $2SiO\ 2H_2O$

21. මැටි ජලය සමඟ එකතු වීමේ දී ඇතිවන ඇලෙනසුළු බව ,
I. සවිවරතාව. II. සුවිකාර්යතාව. III. හැකිළීම. Iv. ඝනත්වය.

22. මැටි නිෂ්පාදන ක්‍රම රාශියක් ඇත. එකම ප්‍රමාණයේ එකම හැඩයේ මැටි භාණ්ඩ රැසක් පහසුවෙන් නිෂ්පාදනය කරගත හැකි මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රමය වන්නේ ,
I. සකපෝරුවේ භාණ්ඩ තැනීම. II. මැටි තහඩු ක්‍රමය.
III. මැටි දරණු මගින් භාණ්ඩ තැනීම. Iv. අච්චු භාවිතයෙන් භාණ්ඩ තැනීම.

23. සකපෝරුව මඟින් භාණ්ඩ ඉදිකිරීමේ දී මධ්‍යගත කරගත් මැටි පිඬ තෙරපා වයනය ලබා ගැනීමෙන් අපේක්ෂා කරනුයේ ,
I. බඳුනේ සමබරතාවය රඳවා ගැනීම.
II. බඳුනේ උස සැකසීම.
III. භාණ්ඩය ඉදිකිරීමට සුදුසු තත්වයට පත් වීම.
Iv. බඳුන සකපෝරුවෙන් ඉවත් කර ගැනීම පහසු කර ගැනීම.

24. මැටි දරණු භාවිතයෙන් භාණ්ඩ තැනීමේ දී දරණු එකිනෙකට කඩතොලු කර සම්බන්ධ කිරීමට යොදා ගන්නා ආලේපය හඳුවන්නේ ,
I. පාම් පිටි. II. බයින්ඩර් ගම් ලෙසය. III. මැටි පාප්පය. Iv. සෙරමික් ක්ලේය.

25. සිසල් , රැමී , මැනිලා වැනි කෙඳි ලබා ගන්නේ ශාකයේ කුමන කොටසින් ද?
I. පත්‍ර වලිනි. II. ගෙඩි වලිනි. III. කඳ කොටසිනි. Iv. මුල් වලිනි.

26. ලෝම කෙඳි පිස්සීමේ දී දක්නට ලැබෙන දෙයකි.
I. පිහාටු පිලිස්සෙන ගඳ වහනය වීම. II. වේගයෙන් පිළිස්සීම.
III. කඩදාසි පිළිස්සෙන ගඳ වහනය වීම. Iv. ගිනි ගැනෘමේ දී ගුලියක් නොසෑදේ.

27. හණ කෙඳි මගින් වියන ලබනු රෙදි හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
I. විස්කෝස්. II. ලිනන්. III. පොප්ලින්. Iv. නයිලෝන්.

28. සේද කෙඳි ලබා ගන්නා සත්ව විශේෂය වන්නේ ,
I. බැටළුවා. II. විකුණා. III. පට පණුවා. Iv. නයිලෝන්

29. මැටි තහඩුවක කැටයමක් නිර්මාණය කිරීමේ දී අඩක් හාරා කැටයම මතුකර ගන්නා ක්‍රමය හඳුන්වන්නේ ,
I. අල්ප උන්නත කැටයම නමිනි. II. අධි උන්නත කැටයම නමිනි.
III. අර්ධ උන්නත කැටයම නමිනි. Iv. සම්පින්ඩනය නමිනි.

30. කතිර මැහුම් ක්‍රමයට අයිඩා රෙද්දක විස්තුරු නිර්මාණයනක් කිරීමට සුදුසු ඉදිකටු වර්ගය වන්නේ,
I. මැෂින් ඉදිකටු. II. අයිඩා ඉදිකටු. III. ටැපෙස්ට්‍රි ඉදිකටු. Iv. සිහින් ඉදිකටු.

31. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණයේ දී සැහැල්ලු බව පිළිබඳ සැලකිලිමත් විය යුතුය. ඒ සඳහා පිරවීම සඳහා සුදුසුම ද්‍රව්‍ය වන්නේ ,
I. ස්පොන්ච්. II. රෙදි කැබලි. III. සෘජුෆෝම්. Iv. පොලිෆීල්.

32. පල්ප මාධ්‍යයෙන් විවිධ නිර්මාණ සිදු කෙරේ. කඩදාසි පල්ප මාධ්‍යයෙන් නිර්මාණ කිරීමේ දී කෘමි සතුන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා භාවිත කරන්නේ ,
I. කරාබුනැටි තෙල් , ලින්සිඩ් ඔයිල් ය. II. පොල් තෙල් , කරාබුනැටි තෙල් ය.
III. මී තෙල් , පොල් තෙල් ය. Iv. මී ඉටි , තල තෙල් ය.

33. බතික් නිර්මාණ සඳහා සකස් කළ ඉටි මිශ්‍රණයේ රට දුම්මල හා මී ඉටි වැඩි වුවහොත් සිදුවන්නේ ,
I. ඉටි ඉවත් කිරීම අපහසු වීම. II. ඉටිවල පිපිරීම් ප්‍රමාණය අඩු වීම.
III. අලංකාර සියුම් රේඛා ලබා ගැනීමට හැකි වීම. Iv. ඉහත කිසිවක් නොවේ.

34. කඩදාසි භාවිතයෙන් සකස් කරගන්නා මල් කල්තබා ගැනීමට කළ හැකි ක්‍රියාකාරකමකි ,
I. කඩදාසි මල් වෙට් පොම්වල බහා තැබීම. II. මල් නිතර පිරිසිදු කිරීම.
III. කඩදාසි මල් ඉටි ගැල්වීම. Iv. ඇස්ප්‍රීන් මිශ්‍ර ජලයේ ගිල්වා තැබීම.

35. සුරතල් සතුන් අතරින් ටෙඩිබෙයා කැපී පෙනේ. ටෙඩිබෙයාර් නිර්මාණයේ දී යොදා ගන්නා රෙදි වර්ග ඇතුළත් කාණ්ඩය වන්නේ ,
I. සිල්ක් , නයිලෝන් , ෆෙල්ට්. II. බෝවා , නයිලෝන් , වෙල්බෝවා.
III. කපු , බෝවා , පොලියෙස්ටර්. Iv. බෝවා , ෆෙල්ට් , වෙල්බෝවා.

36. පැච්වරක් නිර්මාණයක් අලංකාරව මෙන්ම රෙදි කැබලි අපතේ නොයෑමට කළ හැක්කේ ,
I. පතරොමක් සකස්කර ගැනීම. II. නිවැරදිව මූට්ටු කිරීම.
III. විසිතුරු අලංකාර මැහුම් ක්‍රම යෙදීම. Iv. ඉහත කිසිවක් නොවේ.

37. කෘත්‍රිම ආභරණ සකස් කිරීමේ දී පරිසරය හිතකාමී අමුද්‍රව්‍යක් ලෙස භාවිත කළ හැකි වන්නේ ,
I. කඩදාසි පබළු. II. ප්ලාස්ටික් පබළු. III. කම්බි ය. Iv. වීදුරු.

38. පළමු පිලිස්සීමෙන් පසු මැටි භාණ්ඩයකට මෝස්තර යෙදීමේ ක්‍රමයකි,
I. සීරුම් රටා යෙදීම. II. ජේකඩ යෙදීම. III. සායම් වක් කිරීම. Iv. කැටයම් කිරීම.

39. සෙරමික් භාණ්ඩ සඳහා හම් පදම් අවස්ථාවේ දී යෙදිය හැකි අලංකරණ ක්‍රමයකි ,
I. සායම් ඉසීම. II. ගුරුගල් ආලේපනය.
III. සායම්වල ගිල්වීම. Iv. ස්ටෙන්සිල් මුද්‍රණය.

40. විවිධ මාධ්‍ය භාවිතයෙන් කෘත්‍රිම ආභරණ නිර්මාණය වර්තමානයේ ජනප්‍රිය කලාවකි. කෘත්‍රිම ආභරණ නිර්මාණය සඳහා යොදාගත හැකි මාධ්‍ය ඇතුලත් පිළිතුරු තෝරන්න.
I. සිප්පි කටු , පාන් ක්ලේ. II. පැන් ක්ලේ , සියඹලා ඇට.
III. ඉගිනි ඇට , බෙල්ලන්. Iv. පාන් ක්ලේ , සෙරමික් ක්ලේ.

## II කොටස

- පළමුවැනි ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක්ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ජනකලාව පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් ප්‍රදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කර ඇති වෙළඳ ප්‍රදර්ශනය හා අත්කම් තරඟාවලිය 2023 දෙසැම්බර් 22 වන දින කුරුණෑගල මහජන ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට සියල්ල සූදානම් කර ඇත.

I. මෙම ප්‍රදර්ශනය සඳහා තේමා පාඨයක් නිර්මාණය කරන්න.
II. තේමා පාඨය ඇතුලත් ප්‍රචාරක දැන්වීමක අකෘතියක් නිර්මාණය කරන්න.
III. උත්සවයේ පොල්තෙල් පහන සැරසීමට යොදාගත හැකි අමුද්‍රව්‍ය 2 ක් නම් කරන්න.
IV. ප්‍රදර්ශනය සංවිධානය කළ සංවිධායක මණ්ඩලය සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.
V. අලෙවිය සඳහා සකස් කළ හැකි රෙදි කැබලි ආශ්‍රිත නිර්මාණ දෙකක් ලියන්න.
VI. ආරාධිතයින් සඳහා කෙටි කෑම පිළිගැන්වීමට සුදුසු ඇසුරුමක රූපීය පෙනුම අඳින්න.
VII. ප්‍රදර්ශන භූමියේ පිවිසුම අලංකාර කිරීමට සුදුසු තොරණක් අඳින්න.
VIII. නිවේදක පුවරුව අලංකාර කිරීමට සුදුසු මල් වර්ග දෙකක් නම් කරන්න.( ස්වාභාවික )
IX. ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා තූර්ය වාදක කණ්ඩායම සහභාගි වේ. ඔවුන්ගේ ඇඳුම අලංකාර කරගත හැකි රෙදි පින්තාරු ක්‍රම දෙකක් නම් කරන්න.
X. උත්සව ශාලාව අලංකාර කිරීම සඳහා බිත්ති සැරසිලි යොදා ගැනීමට යෝජනා විය. බිත්ති සැරසිලි නිර්මාණයට සුදුසු ජ්‍යාමිතික හැඩතල දෙකක් ඇඳ නම් කරන්න. ( ලකුණු $2 \times 10$ - 20 )

02. චිත්‍ර ශිල්පයේ හැකියාව අඩු අයෙකුට වුවද නිර්මාණ බිහිකල හැකි රෙදිපිළි අලංකරණ ක්‍රම වර්තමානයේ ජනප්‍රියව පවතී.


I. තිර රාමු මුද්‍රණ ක්‍රමයේ උසස් මුද්‍රණ ක්‍රියාවලියක් සඳහා රාමුවක පැවතිය යුතු ලක්ෂණ 2 ක් නම් කරන්න. (ලකුණු 02)
II. අවුරුදු 15ක පමණ වයස පිරිමි දරුවකුගේ ටී ෂර්ට් එකක් සඳහා තිර රාමු මුද්‍රණයකට සුදුසු නිර්මාණයක් අඳින්න. ( ලකුණු 04 )
III. තාප බන්ධිත ක්‍රමයට කොට්ට උරයක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

03. නිවැරදි හැඩතල හා මිනුම් භාවිතය මෙන්ම සැලසුම් චිත්‍ර ඇඳීම තුළින් සාර්ථක නිර්මාන බිහිකල හැකිය.

I. ඉලිප්සය ඇඳීමේ ක්‍රම නම් කරන්න. ( ලකුණු 02 )
II. ඉලිප්සාකාර හැඩයෙන් යුත් වස්තු හතරක් නම් කරන්න. ( ලකුණු 04 )
III. ඉලිප්සය ඇඳීමට යොදා ගන්නා එක් ක්‍රමයකට මහා අක්ෂය 6 cm, සුළු අක්ෂය 4 cm ක් වූ ඉලිප්සය නිර්මාණය කරන්න.

04. අත්පිස්නා හැදයක් සඳහා සකස් කරන ලද නූල් හැදයක දළ රූපසටහනක් සහ විස්තරයක් පහත දැක්වේ.

- හැදයේ දිග 100m.
  හැදයේ පළල 50cm.
  එක් සෙන්ටිමීටරයකට ඇති දික්නූල් ගණන 60.
  දික්නූල් අංකය 2/10 s
  හරස් නූල් අංකය 2/20 s




I. අත් පිස්නා හැදයට අවශ්‍ය දික්නූල් ප්‍රමාණය සොයන්න. (ල.02)
II. ඇඳ රෙදි වියීම සඳහා යොදා ගන්නා සරල හීරි වියමනේ මතුපිට රටාව ඒකක දෙකක් ප්‍රස්තාරගත කරන්න. (ල.04)
III. අත්පිස්නා හැදය සඳහා අවශ්‍ය මුළු දික්නූල් ප්‍රමාණය ගණනය කරන්න. (ල.04)

05. රෙදි නිෂ්පාදනය ඈත අතීතයේ සිට ම ආරම්භ වී විවිධ තත්ත්වයන් මත නොනැසී පැවත එන කර්මාන්තයකි.

I. රෙදි වියීමේ යන්ත්‍ර වර්ග දෙකක් නම් කරන්න. ( ලකුණු 02 )
II. පනාව , පුඩුවැල් පේළි යන උපාංග ඇඳ නම් කර කෙරෙන කාර්ය කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 04 )
III. නූල් එතීමේ උපකරණ කට්ටලය නම් කර ඉන් දෙකක රූපසටහන් අඳින්න.

06. සකපෝරුව භාවිත කර මැටි භාණ්ඩ ඉදි කිරීම ක්‍රි.පූ. 5000 ට පෙර සිට ම පැවතගෙන එන බව පැවසේ.

I. සකපෝරු වර්ග නම් කරන්න. ( ලකුණු 02 )
II. සකපෝරුවක මැටි භාණ්ඩ ඉදි කිරීමේ පියවර නම් කරන්න.
III. මැටි භාණ්ඩයක් ඔප දැමීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන 4 ක් ලියන්න.

07. මිනිසා විසින් ජීවිතයේ විවිධ අවස්ථා සඳහා මල් භාවිත කරයි.

I. මල් (ස්වාභාවික හෝ කෘත්‍රිම) භාවිතයට ගන්නා අවස්ථා 04 ක් නම් කරන්න. ( ලකුණු 02 )
II. මල් කළඹ නිර්මාණයේ දී යොදා ගන්නා හැඩතල දෙකක් නම් කර රූපසටහන් අඳින්න. ( ලකුණු 04 )
III. මල් සැකසුම් සඳහා ස්වාභාවික මල් භාවිතයේ වාසි 2ක් හා අවාසි 2 ක් ලියන්න. ( ලකුණු 04 )